**කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකය) - 2014**

---

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකය) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ල.ර.) සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (කෘ.සං.අ.අ.) අතර 2007 මැයි 08 දින එළඹි අංක 712- එල්කේ දරන ණය ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 5.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකයේ මෙහෙයුම් පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිලියෙල කර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මෙම වාර්තාව නිකුත් කෙරේ. කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනෙහි අනෙකුත් මෙහෙයුම් පිළිබඳ වෙනම වාර්තාවක් 2015 මැයි 20 දින නිකුත් කර ඇත.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම,අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය**

---

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනෙහි ණය ගිවිසුම අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකය ක්‍රියාත්මක කරවීමේ අවසරලත් නියෝජිතායතනය වේ. ප්‍රතිලාභීන්ගේ ආයතනික ධාරිතාවය හා ගණුදෙනු කිරීමේ කුසලතා වඩා ශක්තිමත් කිරීම, සුළු තේ හා රබර් වගාකරුවන්ගේ ඉඩම් භුක්තිය පිළිබඳ තත්ත්වය වැඩි දියුණු කිරීම,පසු අස්වැන්න පරිහරණය,ගබඩා කිරීම ඔවුන්ගේ නිෂ්පාදන සැකසීම හා අලෙවි කිරීම හරහා නිෂ්පාදකයන්ගේ ලාභය වැඩිකිරීම, ග්‍රාමීය මුදල් හා ණය සේවා ප්‍රසාරණය හා වර්ධනය තුලින් කාන්තාවන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම හා දිළිඳුකම අඩුකිරීම පිළිබඳ සහතිකවීම මෙම වැඩසටහනෙහි අරමුණු වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය විශේෂ ගැණුම් හිමිකම් මිලියන 15.25 (එ.ජ.ඩො.මිලියන 23) කට සමාන රු.මිලියන 2,574 ක් වන අතර ඉන් විශේෂ ගැණුම් හිමිකම් මිලියන 1.75 (එ.ජ.ඩො.මිලියන 2.7) කට සමාන රු.මිලියන 295 ක් වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකය සඳහා වෙන් කර ඇත. සංරචකය සඳහා නැවත වෙන් කර තිබූ මුදල ආසන්න වශයෙන් විශේෂ ගැණුම් හිමිකම් මිලියන 2.6 (එ.ජ.ඩො.මිලියන 3.8) කට සමාන රු.මිලියන 494 ක් ලෙස කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල විසින් 2014 සැප්තැම්බර් 19 දින අනුමත කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2010 දී ආරම්භ කළ අතර 2016 දෙසැම්බර් 31 අවසන් කිරීමට නියමිත විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත්

පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනෙහි අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිළිබඳ එවැනි පරීක්ෂා කිරීමද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනෙහි මෙහෙයුම් වලට අදාල පොත්පත්, වාර්තා ආදීයෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව,

(ආ) වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමග වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද වැඩසටහන් වියදම්, දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල් වැඩසටහනෙහි අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මා දරන්නා වු මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ වැඩසටහනෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබු අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය සමාලෝචිත වර්ෂය තුලදී අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යායනය හා ණය සංරචකය සඳහා එකඟ වූ මුදල | | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|
| | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | විශේෂ හැර ගැණුම් හිමිකම් (මිලියන) | රු.මිලියන | විශේෂ හැර ගැණුම් හිමිකම් (මිලියන) | රු.මිලියන | විශේෂ හැර ගැණුම් හිමිකම් (මිලියන) | රු.මිලියන |
| කෘ.සං.අ.අ. | 2.6 | 494 | 0.48 | 90.26 | 1.75 | 340 |

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩසටහන මගින් සහභාගීත්ව මූල්‍යායතන 07 ක් හරහා 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 340 ක් වටිනා ප්‍රතිමූල්‍ය ණය 2,975 ක් මොණරාගල, කෑගල්ල,මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් සඳහා ප්‍රදානය කර තිබුණි. තවද, මුළු ප්‍රතිමූල්‍ය ණය වටිනාකම් එකතුවෙන් සියයට 64 ක් නියෝජනය වන රු.මිලියන 218 ක් වටිනා ප්‍රතිමූල්‍ය ණය 1,717 ක් මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කර තිබුණ අතර, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කර තිබුණේ මුළු ප්‍රතිමූල්‍ය ණය වටිනාකම් එකතුවෙන් සියයට 01 ක් නියෝජනය වන රු.මිලියන 5.08 ක් වටිනා ප්‍රතිමූල්‍ය ණය 68 ක් පමණි. මෙයට අමතරව, රාජ්‍ය අංශයේ සහභාගීත්ව මූල්‍යායතන 03 ක් හරහා ප්‍රතිමූල්‍ය ණය 2,171 ක් ප්‍රදානය කර තිබුණ අතර පෞද්ගලික අංශයේ සහභාගීත්ව මූල්‍යායතන 04 ක් හරහා ප්‍රදානය කර තිබුණේ ණය 804 ක් පමණකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගේ පැහැදිලි කිරීම අනුව, සහභාගීත්ව මූල්‍යායතනවල කාර්යසාධනය තීරණය කිරීමේ පදනම එක් එක් දිස්ත්‍රික්කවල බැංකු ශාඛා ජාලයේ ශක්තිමත්භාවය සහ ඒ පිළිබඳ ඔවුන්ගේ ධාරිතාවය සහ පොළියයි.

### 3.3 චක්‍රීය අරමුදල

වැඩසටහන අවසන් වීමෙන් පසුව ප්‍රතිමූල්‍ය ණය නැවත ලබාදීම නොකඩවා පවත්වාගෙන යාම සඳහා 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමූල්‍ය ණය මුදලෙහි ප්‍රාග්ධන කොටස වන රු.මිලියන 152 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමක තැන්පත් කර තිබුණි.